**පිළිසරු ව්‍යාපෘතිය - 2013**

**---------------------------**

පිළිසරු ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

පිළිසරු ව්‍යාපෘතිය, මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිත කර ඇති පිළිසරු ව්‍යාපෘති අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවනු ලබන්නේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයයි. නිසි සම්පත් සංරක්ෂණය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තහවුරු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අදාල පුද්ගලයින්ගේ දැනීම හා දක්ෂතා වර්ධනය කිරීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, වැඩසටහන් නිරීක්ෂණය කිරීම, පහසුකම් සැපයීම, අවශ්‍ය මූලික ප්‍රතිපාදන සැපයීම, ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ බැංකු ක්‍රමයක් ස්ථාපිත කිරීම, නිසි පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නොකරන පළාත් පාල ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රධාන අරමුණු වේ. වර්ෂ 06 ක් සඳහා වූ අරමුදල් සැලැස්ම අනුව ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.බිලියන 5.6 ක් වේ. ඉන් රු.බිලියන 2.675 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන්ද, රු.බිලියන 03 ක මුදලක් 2008 අයවැය මඟින් හඳුන්වා දී ඇති " හරිත බද්ද " මඟින්ද ලබා ගැනීමට අපේක්ෂිතය. ව්‍යාපෘති යෝජනාව අනුව පිළිසරු ව්‍යාපෘතිය 2008 ජනවාරි 01 දිනෙන් ආරම්භ කර 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත් නියමිත කාලය තුළ ව්‍යාපෘතියේ කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2010 සැප්තැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 10/1905/432/008 හා අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 10/2010 මඟින් ව්‍යාපෘති කාලසීමාව 2011 ජනවාරි 01 දින සිට වසර 03 ක කාල පරිච්ඡේදයක් සඳහා දීර්ඝ කිරීමටත් 2008-2010 දක්වා වූ ඉදිරි තුන් වසරක කාලය තුළ ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන අනුමත කරන ලද රු.බිලියන 5.6 ක වැය සීමාව තුළ සලසා ගැනීමටත් නිර්දේශ කර තිබුණි. 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.බිලියන 0.2 ක් විය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වල අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචන සහ ගනුදෙනුවල නැයැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යමණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිළි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.

පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලනයන් ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සපයන ලද අරමුදල් වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වු වත්කම් හා වගකීම් ආදිය දැක්වෙන පරිදි ප්‍රමාණවත් ගිණුම් වාර්තා අඛණ්ඩ පදනමක් මත පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුකූලව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඈ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඉ) මාගේ පෙර වර්ෂ වල විගණන වාර්තා වලින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

3. මතය
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වල ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මාගේ පෙර වර්ෂ වල විගණන වාර්තා වලින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන
----------------

4.1 මූල්‍ය කාර්යසාධනය
-----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වියදම රු.317,396,336 ක් වු අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,952,031,164 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2013 වර්ෂය සඳහා වියදම | 2012 වර්ෂය සඳහා වියදම | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු |
| කොම්පෝස්ට් අංගන ඉදිකිරීම | 45,816,245 | 55,297,185 | 511,191,805 |
| බිම් පිරවුම් ඉදිකිරීම | 732,443 | 4,255,164 | 17,211,401 |
| කුඩා පරිමාණයේ කොම්පෝස්ට් අංගන සහ ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් | 246,921,008 | 302,556,119 | 1,208,284,882 |
| ප්‍රවාහන (ඉන්ධන හා නඩත්තු) | 2,460,379 | 4,059,468 | 17,624,018 |
| කාර්යාලීය ලිපි ද්‍රව්‍ය සැපයුම් | 726,177 | 2,002,499 | 5,948,026 |
| වැටුප් | 12,915,044 | 22,573,584 | 108,626,343 |
| තැපැල් හා සන්නිවේදන | 285,081 | 349,013 | 3,772,920 |
| ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ කළමනාකරණය | 852,386 | 204,066 | 3,034,053 |
| කාර්යාල කුලී | 4,739,702 | 3,408,800 | 19,347,056 |
| අතිකාල දීමනා | 850,938 | 2,483,391 | 7,312,962 |
| බැංකු ගාස්තු සහ හර බදු | 12,000 | 20,100 | 837,327 |
| රක්ෂණ | - | 254,937 | 2,583,181 |
| වාහන සේවා කිරීම් හා අළුත්වැඩියාව | 1,021,046 | 2,383,072 | 7,159,330 |
| කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයට අදාල වියදම් | - | - | 19,387,597 |
| ව්‍යාපෘති කාර්යමණ්ඩලයේ පුහුණුව සහ ධාරිතාව ගොඩනැගීම | - | - | 5,171,390 |
| වැඩසටහන් දියත් කිරීම | - | - | 4,959,320 |
| වෙනත් | 63,887 | 34,700 | 9,579,553 |
| | 317,396,336 | 399,882,098 | 1,952,031,164 |

5. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ දී ව්‍යාපෘතියට අයත් වාහනයක් සම්බන්ධයෙන් සිදුවූ රු.6,050,000 ක අලාභය, වසර 02 ක් ගතවී තිබුණද වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මු.රෙ. 757 අනුව 2013 වර්ෂය වෙනුවෙන් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

6.1 අරමුදල් උපයෝජනය

ව්‍යාපෘතිය විසින් 2013 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය කළ ආකාරය සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත අරමුදල් උපයෝජනය පිළිබඳ සමහර දත්ත පහත සඳහන් සටහනේ දැක්වේ.

| අරමුදලේ මූලාශ්‍රය | ව්‍යාපෘති කටයුතු සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජිත මුළු මුදල |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| හරිත බද්ද | 3,000 | - | - |
| ශ්‍රී ලංකා රජය | 2,675 | 317 | 1,998 |
| | 5,675 | 317 | 1,998 |

6.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ අරමුණක් වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම යටතේ විවිධ ප්‍රාදේශීය සභාවන් සඳහා කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය මූල්‍ය අනුග්‍රහය දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් වූ විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් කරුණු හෙළිදරව් විය.

(i) තණමල්විල ප්‍රාදේශීය සභාවට පිළිසරු ව්‍යාපෘතිය විසින් කොම්පෝස්ට් අංගනයේ ආරක්ෂිත වැට, කාර්යාලය හා ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා රු.1,806,413 ක ඇස්තමේන්තුගත වටිනාකම මත රු.1,241,652 ක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණද ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම අංගනයේ කටයුතු ආරම්භකර තිබූ බැවින් අපේක්ෂිත අරමුණු වන කැලි කසල බැහැර කිරීම හා පොහොර නිෂ්පාදනය කිරීමට උපරිම ධාරිතාවයෙන් කටයුතු කිරීමට නොහැකි වී තිබුණු බව විගණනයේදී අනාවරණය විය.

(ii) කොලොන්නාව පොතුවිල් කුඹුර මහා පරිමාණ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා රු.මිලියන 100.861 ක වියදම් දරා තිබූ අතර ඒ සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. 2013 මාර්තු 02 දින භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි කොම්පෝස්ට් අංගනය අසල පිහිටි කසල කන්දට යටවීමේ තර්ජනයක් ඇති බව විගණනය විසින් පෙන්වාදී තිබුණද ඒ පිළිබඳව අවධානයක් යොමුකර නොතිබුණි. 2013 දෙසැම්බර් 11 දින එකී කසල කන්ද කොම්පෝස්ට් අංගනය මතට කඩා වැටී තිබුණි. මෙම කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා සහ යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු.මිලියන 114.06 ක් වියදම්කර තිබුණි.

(iii) මහා පරිමාණ කොම්පෝස්ට් අංගන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ යුධගනාව ප්‍රදේශයේ අක්කර 06 ක රු.22,442,860 ක් වැයකර කොම්පෝස්ට් අංගනයක් ඉදිකර තිබුණි. මෙම මහා පරිමාණ කොම්පෝස්ට් ව්‍යාපෘතිය හිඟුරක්ගොඩ හා මැදිරිගිරිය බල ප්‍රදේශ වල කසල භාවිතයෙන් මාසිකව කාබනික පොහොර ටොන් 20 ක් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කර තිබුණද දෛනිකව කසල ට්‍රැක්ටර් 02 ක් පමණක් ලැබී තිබූ බැවින් අදාල ඉල්ක්කය සපුරාගත නොහැකි වී තිබුණි. තවද මෙම අංගනය පවත්වාගෙන යෑම සඳහා වාර්ෂිකව රු.මිලියන 02 ක් පමණ වැය කිරීමට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවට සිදු වී තිබීම හේතුවෙන් මෙම කසල කළමනාකරණ ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

(iv) රු.112,200,183 ක වියදමක් දරා පළාත් පාලන ආයතන 07 ක කසල කළමනාකරණය කිරීම සඳහා ඉදිකරන ලද හික්කඩුව මොන්රෝවියාවත්ත මහා පරිමාණ කොම්පෝස්ට් අංගනයේ කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු සිදු නොවන බව නිරීක්ෂණය විය.

(v) තවද කුඩා පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා පළාත් පාලන ආයතන 12 කට රු.15,705,465 මුදලක් ලබාදී තිබුනද කොම්පෝස්ට් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ගලෙන්බිදුනු වැව ප්‍රාදේශීය සභාව වෙත 2011 නොවැම්බර් 22 දින රු.1,280,663 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබූ නමුත් කොම්පෝස්ට් අංගනයක් ඉදිකර නොතිබුණි. අදාල අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(vi) කුඩා පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදිකිරීම් නිමකර සති 02 ක් ඇතුළත කොම්පෝස්ට් නිපදවීම ආරම්භකළ යුතු වුවත් පළාත් පාලන ආයතන 14 ක රු.44,490,219 ක මුදලක් වියදම් කර ඉදිකර තිබුනු කොම්පෝස්ට් අංගන වල කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භකර නොතිබුණි.

(vii) වෙනත් පළාත් පාලන ආයතන 3 කට කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා රු.3,444,748 ක මුදලක් ලබාදී තිබූ නමුත් මේ වන විට මෙම ව්‍යාපෘති අත්හැර තිබුණි.

(viii) පළාත් පාලන ආයතන විසින් කොම්පෝස්ට් අංගන ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට මසකට පෙර පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු බව ගිවිසුම් පත්‍රයේ සඳහන් කර තිබුණද කොම්පෝස්ට් අංගන 103 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. තවද ව්‍යාපෘතිය විසින් නිෂ්පාදනය කරන පොහොරවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ගල්රිසිඩියා, වල් සූරියකාන්ත, කැප්පෙට්ටියා, ගන්සූරිය වැනි නයිට්‍රජන් බහුල ශාක සහිත වගාවන් ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට ව්‍යාපෘති භූමිය තුළ අඛන්ඩව පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම සහ එම ශාක පත්‍ර කොම්පෝස්ට් නිපදවීමේ අමද්‍රව්‍යයක් ලෙස යොදා ගැනීම සිදුකළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

(ix) කොම්පෝස්ට් අංගන මඟින් නිපදවනු ලබන කාබනික පොහොර නියැදි, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රචලිත කිරීමේ වැඩසටහන මඟින් මාස 03 කට වරක් තත්ත්ව පරීක්ෂාවට ලක්කළ යුතු වුවත් පළාත් පාලන ආයතන 91 විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය විසින් විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(x) බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු කොම්පෝස්ට් අංගනයේ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය තුළින් ජනිත වන අප ජලය බැහැර කිරීම සඳහා ඉදිකළ යුතු ක්ෂරිත ටැංකි ප්‍රමාණාත්මකව හා නිසි ලෙස ඉදිකර ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) පිළිසරු ව්‍යාපෘතිය විසින් 200 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රු. මිලියන 187.93 ක් වැය කර තිබුණද ව්‍යාපෘතියේ මූලික අරමුණු වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අදාල පුද්ගලයන්ගේ දැනුම වර්ධනය වී නොතිබූ බව පළාත් පාලන ආයතන විසින් වෙන්කළ කසල එකතු කිරීමේදී නිරීක්ෂණය විය. තවද ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමේ බඳුන් 6,160 ක් සඳහා රු.19,434,130 ක් වැයකර මිලදී ගෙන පළාත් පාලන ආයතන හා රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර බෙදාහැර තිබුණද එකී අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) බිම් පිරවුම් කටයුතු සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 163 ක් වැයකර තිබුණු නමුත් 2008-2010 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් බිම් පිරවුම් 09 ක් අතුරෙන් කිසිදු බිම් පිරවුමක් 2013 දෙසැම්බර් 31 වන විටත් ස්ථාපනය කර නොතිබුණි.

## 6.3 මානව සම්පත් කළමණාකරණය

------------------------------------

පිළිසරු ව්‍යාපෘතියට 2014 ජුනි 02 දින සිට සම්බන්ධීකරණ නිලධාරීන් 05 දෙනෙකු පත්කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මමත මෙම තනතුරු සඳහා එක් නිලධාරීයෙකුට රු.40,000 ක මාසික වැටුපක් සහ රු.20,000 ක මාසික ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණද මෙම නිලධාරීන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂාකර බඳවාගෙන නොතිබුණු බව හෙළිදරව් විය. එසේම මෙම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. තවද ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ නියෝජ්‍ය කළමනාකරු (මහජන සම්බන්ධතා) යන තනතුරු වලට බඳවා ගැනීමේදී තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් බඳවාගෙන වැටුප් හා දීමනා ලෙස 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.6,403,600 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. මෙම කරුණු විගණනය විසින් පෙන්වා දීමෙන් අනතුරුව එම නිලධාරීන්ගේ සේවය අවසන් කර තිබුණි. කෙසේවෙතත් 2013 වර්ෂයේදී ඔවුන් දෙදෙනා වෙත පාරිතෝෂිත දීමනා ලෙස රු.524,825 ක් ගෙවා තිබුණි.